ලියා දන්වන වග යි

ඕස්ට්‍රේලියාවට
සංක්‍රමණය වූ ශ්‍රී ලාංකික ප්‍රජාව සීය සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කර ගැනීම උදෙසා දක්වන කැපවීම මහත් පැසසුම් කටයුතු ය. කලකට පමා දැනිත්තට පිබූ කලු සුදදන් වීමේ මානසිකත්වයෙන් බැහැරවා යමින් අපේ අනගතතාවය රැකගෙන මේ සමාජය තුළ ඉදිරියට යා හැකි බව දැන් පැහැදිළිය.

අපේ සංස්කෘතික වටිනාකම් රැක ගැනීමේ පරමාර්ථයෙන් දියත් වන ගොයෙකුත් ව්‍යාපෘති ඇත. මේවා අතරින් ලක්ෂදාදර පදනම විසින් දියත් කර ඇති ශ්‍රී ලාංකික ප්‍රජාව සඳහා සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය ඉතා වැදගත් එකක් යයි යැයි අපි සිතමු.

මෙය බොහෝ කාලයක් අතපසු වූ කර්තව්‍යයක් බව පැහැදිළි ය. පංගු පේරුවකින් තාරව සෑම ශ්‍රී ලාංකිකයෙකුගේ ම සහය මේ ව්‍යාපෘතිටට ලැබිය යුතු ම ය.

මෙරටේ ජීවත් වන විවිධ ජාතිත්ව අයත් බොහෝ ජන කොටස් වෙනුවෙන් ඉදි කර ගත් සංස්කෘතික මධ්‍යස්ථාන අපි දැක ඇත්තෙමු. මේවා හුදු ගොඩනැගිලි හොවන බව අපි දන්නෙමු. ඒ ඒ ජාතිත්ව අයත් විවිධාකාර වූ සංස්කෘතික වටිනාකම් රැක ගනු පස්සේ මේ මධ්‍යස්ථාන මඟින් දියත් කෙරන විවිධ වැඩ සටහන් ඇත. තමන්ගේ අනගතතාව රැක ගෙන මේ බහුවාර්ගික සමාජය තුළ ජීවත් වීමේ වැදගත් කම සෑම ජාතියක්ම වටහා ගෙන ඇති බවට මේ මධ්‍යස්ථාන සාධක ය.

ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන් සංස්කෘතික මධ්‍යස්ථානයක් ගොඩ නැගීම ඉතිහාස කර්තව්‍යයක් නොවේ. මේ අපහසු ව්‍යයාගාමය ජයග්‍රහණය කළ පසු ඉදිවන්නේ හුදු ගොඩනැගිල්ලක් පමණක් නොවන බවට ද වග බලා ගත යුතු ය.



ශ්‍රී ලංකේය ජනතාව තමන් පිළිබඳ තැබූ විශ්වාසය තුටුවූ දෙකකට සීමා නොකළ ජනාධිපතිනිය, එල්ටීටීම් සංවිධානය සමඟ බලය බෙදා ගැනීමේ ලියවිල්ලක් වූ ඒකාබද්ධ යාන්ත්‍රණ ලියවිල්ලට අමාතයංශ ලේකම්වරයෙකු ලවා රජයේ මුද්‍රාව තැබී ය. ශ්‍රී ලංකේය ජනතාව එක්සත් ජනතා නිදහස් සන්ධානය බලයට පත්කර ගනු ලැබුවේ, නිකත් හාල්, කුකයි පනහට පාන් හෝ වෙනත් බඩගෝස්තරවාදී පොරොන්දුවකට නොව රටේ ඒකීයභාවය, භෞමික අඛණ්ඩතාව හා ස්වෛරීභාවය දිළිහිමියන් සුරක්ෂිත බව දැන් පොරොන්දුව නිසා ය.

එහෙත් තමන් කොතරම් ප්‍රගතිශීලී, ලිබරල්වාදී, වර්තයක් දැයි කියුව ද, තවමත් රාදල මානසිකත්වයෙන් නොමිදුණ, බලයට කැඳව පුද්ගල අභිමතාර්ථ මත දේපාලනයේ යෙදෙන බලයෙන් හිස උදුම්මාගත් හා ශ්‍රී ලංකාවේ මෙතෙක් සිටි නායකයන්ට වඩා වෙනස් නොවන බව ඔප්පු කරමින් ජනාධිපතිනිය එම පොරොන්දු පසව පැදුණු දුවිල්ලක් තරම් හෝ සැලකීමකින් තොරව ගත් මෙම පියවරත් සමඟ ශ්‍රී ලංකාය දේශපාලය දරුණු 'ක්‍රපාණියකට' හසුව තිබේ.

ජනාධිපතිනිය එල්ටීටීම් සංවිධානය සමඟ සහයෝගයට යෑම නිසා ජනතාව ලෙසින් තඹලන් සාදාගත් සන්ධාන ආණ්ඩුව අස්වාරව වී තිබේ. එසේ වී ඇත්තේ සන්ධානයේ ප්‍රධාන පාර්ශ්වකරුවා වූ ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවෙන් ඉවත් වීම නිසා ය. මේ සමඟ ම පළාත් සභාවල ද සන්ධානයට බලය අහිමි වීමේ අවදානමක් මතුව තිබේ.

ඒකාබද්ධ යාන්ත්‍රණයට අත්සන් තැබීමත් සමඟ ආණ්ඩුව පමණක් නොව, ජනතා විමුක්ති පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය, මුස්ලිම් පක්ෂ හා නාගකයන්, භික්ෂූන් වහන්සේලා, මෙන් ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ද අර්බුදයකට මුහුණ පෑමට සිදුව ඇත. යාන්ත්‍රණයට අත්සන් කිරීමත් සමඟ ආණ්ඩුව සුළතර ආණ්ඩුවක් වූ පසු ආණ්ඩුවට සහාය දෙන්නට සූදානමින් සිටි මුස්ලිම් කොංග්‍රසයට අද එය කිරීමට නොහැකි වී ඇත. ඒ මෙම ගිවිසුම මගින් මුස්ලිම් ප්‍රජාව කොන්තර ඇති බැවිනි. මේ නිසා ආණ්ඩුව නියෝජනය කරන රෙපියුස් ලණ්ඩන් වැනි දේශපාලනඥයන් ද අර්බුදයකට තල්ලු කර ඇත. ඒ ආණ්ඩුවෙන් ඉවත් විය යුතු බවට ඔවුන්ගේ ප්‍රජාවන්ගෙන් එල්ල වන බලපෑම නිසාවෙනි. ගිවිසුමට විරෝධය පල කරමින් රෙපියුස් අමුරොෆ් මහත්මියගේ පක්ෂයේ නියෝජන නායක එම්.එල්.ඒ.එම් හිස්මුල්ලා මහතා ද මේ වන විට තමන් දරු ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගමේ සභාපති ධූරයෙන් ඉල්ලා අස්වී ඇත.

රෙපියුස් අමුරොෆ් මහත්මිය පමණක් නොව සිංහල බෞද්ධ ජාතික පදනමක් ඇති දිනේෂ් ගුණවර්ධන අමාත්‍යවරයාට ද තම පැවැත්ම පිළිබඳ බරපතල ප්‍රශ්නයක් මතුව තිබේ.

මහානායක හිමිවරුන්ගේ ඉල්ලීම මත යාන්ත්‍රණයට එරෙහිව පැවැති භික්ෂූන් වහන්සේලාගේ මාරාන්තික උපවාස අත්හිටවනු ලැබූව ද, ජනාධිපතිනිය යාන්ත්‍රණයට අත්සන් තැබූවේ මහානායක හිමිවරුන් ද මුලාවේ දමමිනි. මේ නිසා මහානායක හිමිවරුන් ද නිරුත්තර වී සිටිති. ඒ අතරේ ජනාධිපතිනියට එරෙහිව සංඝ ආඥාවක් නිකුත් කළ යුතු බවට හෙළ උරුමය, ජාතික භික්ෂු පෙරමුණ, සංඝ සම්මේලනය වැනි භික්ෂු සංවිධානවලින් උන්වහන්සේලා වෙත ලපලාම් එල්ල වන්නට පටන් ගෙන තිබේ.

අනෙකුත් ජාතික ප්‍රශ්නවල දී මෙන් ම මෙම යාන්ත්‍රණ ගිවිසුම සම්බන්ධයෙන් ද එක්සත් ජාතික පක්ෂය අනුගමනය කරනු ලැබූවේ ලෙඩේ ප්‍රතිපත්තියකි. ගිවිසුම නිසා ජනතා විමුක්ති පෙරමුණ සන්ධානයෙන් ඉවත් වීම පිළිබඳ සතුටු වන නමුත්, ආණ්ඩුවට සහාය දක්වීමට එක්සත් ජාතික පක්ෂය සූදානම් නැත. රනිල් වික්‍රමසිංහට අවශ්‍යව ඇත්තේ ජනාධිපතිවරයා වීමට ය. එහෙත් එක්සත් ජාතික පක්ෂිකයන්ට අවශ්‍ය ආණ්ඩුවක් පිහිටුවීම ය. මෙම පරස්පරය තුළ එක්සත් ජාතික පක්ෂ නායකත්වය අර්බුදයකට මුහුණ පා සිටී.

මෙසේ වෙතත් මේ සියල්ලට ම වඩා අර්බුදයට පත්ව සිටින්නේ ජනාධිපතිනිය ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ය. ජනතා විමුක්ති පෙරමුණ සන්ධානයෙන් ඉවත් ආණ්ඩුවෙන් ඉවත් වන තුරු ම ඔවුන් ඉවත් වනු ඇතැයි ජනාධිපතිනිය විශ්වාසය කලේ නැත. ඇය ජනතා විමුක්ති පෙරමුණ තක්සෙ'රු කරනු ලැබුවේ ද පැරණි වාමාංශික පක්ෂ තක්සේරු කළ අන්දමට ය. ජවිපෙ ආණ්ඩුවෙන් ඉවත් නොවනු ඇතැයි යන දැඩි විශ්වාසය නිසා ඉවත් වුවහොත් කරන්නේ කුමක්දැයි ජනාධිපතිනියට අදහසක් තිබුණේ නැත.

මේ නිසා, ජවිපෙ ඉවත් වීමෙන් පසු ඇය කරන්නේ කුමක් ද, කියන්නේ කුමක් ද? තෝරා බේරාගත නොහැකි දේශපාලන අනාථ භාවයකට පත්ව සිටී. එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව භාර ගැනීමට සූදානම් නොමිනි නිසා, ඉදිරි අයවැය එනතෙක් ආණ්ඩුව පවත්වාගෙන යෑමට හැකි ය. එහෙත් අයවැයෙන් ආණ්ඩුව පරාජ වුවහොත් ජනාධිපතිනිය යළි පත් වන්නේ 2004 ට පෙර සිටි තත්වයට ය. එහෙම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් සමඟ කටයුතු කිරීමට ය.

අයවැය දක්වා යා හැකියැයි සිතා සිටිය ද දිනෙන් දින ආණ්ඩුවේ ශක්තිය මෙන් ම ඒ පිළිබඳ ඇති ජනතා විශ්වාසය ද හෝදා පාවවල ලක්වනු ඇත. එවිට ඉතිරි කුමන හෝ ගැබ්වරණයකට මුහුණ දීමට ඇැයට සිදු වන්නේ නොමඟේ ගසන අග්වයකු වැනි ආණ්ඩුවක් සමඟ ය.

ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවෙන් ඉවත් වීමත් සමඟ ජනාධිපතිනිය කෙතරම්



අසරණ වුණේ ද යන්න තේරුම් ගත හැක්කේ හුදුම් ආණ්ඩුවක් සඳහා එක්සත් ජාතික පක්ෂයට ආරාධනා කිරීම මඟිනි. අමාත්‍ය මණ්ඩලය 50 ට 50 බෙදාගන්නවත්, අවශ්‍ය නම් රනිල් වික්‍රමසිංහ මහතාට අගමැති ධූරය පිරිනමන්නවත් සූදානම් බව ඇය ඉගිකොට තිබේණ, එක්සත් ජාතික පක්ෂය එම යෝජනාව ප්‍රතික්ෂේප කොට තිබේ.

දොළොත් වන පිටව

සංස්කරණය
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

සමබන්ධීකරණය

NSW
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

WA
Kapila Hemantha Balage
08 9456 1972

QLD
Ananada Samaratunga
07 3372 7953

ACT
Asoka Nimalasiri
0439 925 241

SA
Nevil Asoka
08 8396 6834

TAS
Anura Seneviratne
03 6327 4259

සන්නස පිරිවර

සිසිර දිසානායක	Sisira Dissanayaka
ශ්‍රීනාත් මද්දුමගේ	Srinath Maddumage
අසෝක සුබසිංහ	Asoka Subasinghe
සාලිය ගලප්පත්ති	Saliya Galappaththi
වී ක ධර්මබන්ධු	W. K. Dharmabandhu
ආචාර්ය විද්‍යාකි මනතුංග	Dr Vidyani Manathunga
චන්දි මාපා	Chandi Mapa
ශ්‍රියාණි මද්දුමගේ	Sriyani Maddumage
මහින්ද දිසානායක දිවුල්ගහේ	Mahinda Dissanayaka Diwulgane
සංජීව පොතුපිටියගේ	Sanjeewa Pothupitiyahe

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

සන්නස SANNASA
අපේ උරුමය ගැටුණුවේ

පිටු සැකසුම්/ගැස්ට් හිරිමණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

ගොදාගැටීම් සහය
ප්‍රියන්ත පෙරේරා

Sannasa
PO Box 172 Reservoir
Vic 3073 Australia
Web: www.sannasa.net
email : info@sannasa.net
Tel : 03 9310 4196 /0425 720 932
Fax : 03 9310 5569